# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2196/51 - 2020 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2020.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE)
මාදිලි අනුමැති රීති 2020

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 5 (ච), 5 (ට), 5 (න) සහ 5 (ප) වගන්ති සමග කියවිය යුතු 68 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාදන ලද රීති.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

2020 ජුනි මස 17 වන දින,
කොළඹදීය.

*රීති*

(1) මෙහි මින් මතු "ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති" යනුවෙන් හඳුන්වන, මෙම රීති ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති , 2020 යනුවෙන් හැඳින්වේ.

(2) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති 2020.12.16 දින සිට බලපැවැත්වේ.

(3) ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීමට, අළෙවි කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ භාවිතා කිරීමට අපේක්ෂා කරන සියලුම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති අදාළ වේ.

(4) මෙහි මින් මතු ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති සවිස්තරාත්මකව පැහැදිලි කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I. කොටස | : | ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීතිවල පරමාර්ථ විෂය පථය සහ අරමුණු |
| II. කොටස | : | නිර්වචන සහ කෙටි යෙදුම් |
| III. කොටස | : | මාදිලි අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේ පටිපාටිය |
| IV. කොටස | : | මාදිලි අනුමැති කළමනාකරණය |
| V. කොටස | : | නියාමන රාමුව |

පටුන

I. කොටස : ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීතිවල පරමාර්ථය, විෂයපථය සහ අරමුණු

(1) පරමාර්ථය
(2) විෂයය පථය
(3) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැතිය සඳහා අනිවාර්ය නියමයන්
(4) අරමුණු

II. කොටස : නිර්වචන සහ කෙටි යෙදුම්

(5) නිර්වචන
(6) කෙටි යෙදුම්
(7) රීති පරිශිෂ්ටයන්

III. කොටස : මාදිලි අනුමැතිය සඳහා අයදුම් කිරීමේ පටිපාටිය

(8) මාදිලි අනුමැති අයදුම්පත්‍රය
(9) අයදුම්පත් ක්‍රියාවලිය

IV. කොටස : මාදිලි අනුමැති පාලනය

(10) සම්මත මාදිලි අනුමැතිය
(11) සරල මාදිලි අනුමැතිය
(12) මාදිලි අනුමැති ගාස්තු
(13) මාදිලි අනුමැති ප්‍රමිති
(14) පිළිගත් පරීක්ෂණ විද්‍යාගාර
(15) මාදිලි අනුමැති සහතිකය
(16) මාදිලි අනුමැති ලේඛනය
(17) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙනස් කිරීම්

V. කොටස : නියාමන රාමුව

(18) ලේබල් කිරීම
(19) පිරික්සීම සහ ආවේක්ෂණය
(20) මාදිලි අනුමැතියෙන් නිදහස් වීම
(21) මාදිලි අනුමැති වලංගුභාවය සහ යාවත්කාලීන කිරීම
(22) පැවරීම
(23) මාදිලි අනුමැතිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම

VI. කොටස : ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම.

(24) මාදිලි අනුමැතිය සඳහා ආදර්ශක නියැදි (ය) ආනයනය කිරීම
(25) වාණිජමය අරමුණු සහ ස්වකීය පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම
(26) පුද්ගලික පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම
(27) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ප්‍රති-අපනයනය කිරීම

VII. කොටස : පරිශිෂ්ටයන්

(28) ඇමුණුම්

| | | |
|---|---|---|
| පරිශිෂ්ටය අ | - | සම්මත මාදිලි අනුමැති ආකෘති පත්‍රය |
| පරිශිෂ්ටය ආ | - | සරල මාදිලි අනුමැති ආකෘති පත්‍රය |
| පරිශිෂ්ටය ඇ | - | අනුකූලතා ප්‍රකාශනය සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ |
| පරිශිෂ්ටය ඈ | - | මාදිලි අනුමැතිය සහ වෙනත් අදාළ ගාස්තු |
| පරිශිෂ්ටය ඉ | - | ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති ප්‍රමිති |
| පරිශිෂ්ටය ඊ | - | මාදිලි අනුමැති සහතිකපත් |
| පරිශිෂ්ටය උ | - | මාදිලි අනුමැති ලේබල |
| පරිශිෂ්ටය ඌ | - | මාදිලි අනුමැතිය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආදර්ශක නියැදි ආනයන කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය එ | - | මාදිලි අනුමැතිය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආදර්ශක නියැදි සඳහා රේගු නිෂ්කාශනය ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඒ | - | වාණිජමය අරමුණු සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඔ | - | වාණිජමය අරමුණු සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල රේගු නිෂ්කාශනය ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඕ | - | පුද්ගලික පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා රේගු නිෂ්කාශනය ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ක | - | ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ප්‍රති අපනයනය කිරීමට අවසර ලබා ගැනීමේ අයදුම්පත්‍රය |

## I කොටස : ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීතිවල පරමාර්ථය, විෂය පථය සහ අරමුණු

### 1. පරමාර්ථය

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීතිවල පරමාර්ථය වන්නේ මෙම රීතිවල සඳහන් නියාමන ප්‍රමිතිවලට සහ අනුකූලතාවය සහ ආරක්ෂණය සඳහා වන අවශ්‍යතාවයන්ට අනුකූලව ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක් බවට සහතික කිරීමයි. මාදිලි අනුමැතිය මගින් ප්‍රශස්ත ජාල කාර්ය සාධනය ඇති කිරීම, ජාල විකෘතිතා සහ අවක්‍රමණය වළක්වා ගැනීම, අවහිරතාවලින් වැළැකීම, ජාල අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සහ වෙළඳපලේ පවත්නා තත්ත්වයෙන් බාල ප්‍රමිතියෙන් තොර උපකරණ ඉවත් කිරීම සහතික කිරීමයි.

### 2. විෂයය පථය

(1) ශ්‍රී ලංකාව තුළ ආනයනය කරන, අලෙවිකරණ හෝ පරිහරණය කිරීමට අපේක්ෂිත සියලුම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ග සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති අදාළ වේ. සියලුම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම, අළෙවි කිරීම හෝ ක්‍රියා කරවීමට පෙර මාදිලි අනුමැතිය ලබාගත යුතු බවට කොමිෂන් සභාව අවධාරණය කරයි.

(2) ඇතැම් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ග (කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන) ආනයනය කිරීම මාදිලි අනුමැතිය ලබා ගැනීමෙන් නිදහස් වේ.

(3) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිශ්පාදනය කිරීම/ ආනයන කිරීම/ විකිණීම/ පරිහරණය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ව්‍යාපාරික ආයතනය එම උපකරණය ශ්‍රී ලංකාවේ පරිහරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මාදිලි අනුමැතිය ලබා දී ඇති බව ප්‍රථමයෙන් සහතික කර ගත යුතුය. මාදිලි අනුමැතිය ලබා දී ඇති ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ග ඇතුළත් මාදිලි අනුමැතිය පිළිබඳ ලේඛනයක් කොමිෂන් සභාව විසින් සිය වෙබ් අඩවියේ පවත්වා ගෙන යයි.

(4) මෙම රීති මගින් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙළඳපලට නිකුත් කිරීමට පෙර මාදිලි අනුමැතිය ලබා ගැනීම සහ අදාළ තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල බව බලාත්මක කරයි.

### 3. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැතිය සඳහා අත්‍යාවශ්‍යය අවශ්‍යතා

(1) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 5(ට) වගන්තිය ප්‍රකාරව සියලුම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා කොමිෂන් සභාව මගින් අනුමැතිය ලබා ගත යුතුය.

(2) විදුලි සංදේශ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව යනු ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති එකම නීත්‍යානුකූල ආයතනයයි. පරිහරණය කරන්නන් අතර අවහිරතා අවම කිරීම සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණයේ එක් ප්‍රධාන කාර්යයකි. නිසි තාක්ෂණික පිරිවිතර යොදා ගැනීම තුළින් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පරිහරණය කරන්නන් අතර පැහැදිලිව අවහිරතා ඉවත් කිරීම/අවම කිරීම කරනු ලැබේ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල තාක්ෂණික පිරිවිතරයන් කොමිෂන් සභාවේ මාදිලි අනුමැති අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු අතර එමගින් සංඛ්‍යාත වර්ණාවලිය ඵලදායීව හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහතික කෙරේ.

### 4. අරමුණු

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීතිවල ප්‍රධාන අරමුණ වන්නේ,

(අ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල මාදිලි අනුමැති ක්‍රියාවලිය නිර්වචනය කිරීම;

(ආ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල මෙහෙයුම් සංඛ්‍යාත ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුවට අනුකූල වන බව නිසැක කිරීම;

(ඇ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙනත් ගුවන් විදුලි සන්නිවේදන සේවාවලට හෝ විදුලි සංදේශ ජාලවලට අවහිරතා ඇති කිරීමකින් තොරව නිශ්චිතව දක්වා ඇති තාක්ෂණික පිරිවිතර තුළ ක්‍රියා කරවනු ලබන බව සහ වෙනත් ගුවන් විදුලි සන්නිවේදන සේවා හෝ විදුලි සංදේශ ජාලවල බාධාවකින් තොරව ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිශ්චිත තාක්ෂණික පිරිවිතරයන් තුළ ක්‍රියාත්මක වන බවට සහතික කිරීම ;

(ඈ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මගින් උත්පාදනය කරන ලද විද්‍යුත් චුම්භක බාධාවන් ආසන්නයේ පිහිටි වෙනත් උපකරණවල ක්‍රියාකාරී මෙහෙයුම් අවක්‍රමණය නොකිරීම සහතික කිරීම සහ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආසන්නයේ වෙනත් උපකරණවල මෙහෙයුම් වල ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි විද්‍යුත් චුම්භක බාධාවන් පිළිගත හැකි පරිදි වැලැක්වීමේ හැකියා මට්ටමකින් සමන්විත යුතු වීම;

(ඉ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මිලදී ගැනීමට පෙර, එම උපකරණ පරිශිෂ්ට ඉ සහ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීතිවලට අනුකූල බව නිසැක කර ගැනීම පිණිස අවශ්‍ය දැනුවත් භාවය ලබාදීමට පරිහරණය කරන්නන් සවිබල ගැන්වීම;

(ඊ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ භාවිතා කිරීමෙන් පැන නැගිය හැකි විද්‍යුත් උපද්‍රව හෝ කිසියම් වෙනත් හානිකර විමෝචන මගින් අවසන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහ සෞඛ්‍යය ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

(උ) ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාලවලට අනුකූල නොවන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වලින් පරිහරණය කරන්නන් ආරක්ෂා කිරීම.

(ඌ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සැපයීමෙහිලා තරගකාරීත්වය ඇති කිරීම සහ පරිහරණය කරන්නාට දැරිය හැකි මිල ගණන් යටතේ විවිධ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ලබාගත හැකි බව දිරිගැන්වීම.

## II කොටස - 2 නිර්වචන සහ කෙටි යෙදුම්

**5. නිර්වචන**

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම රීතිවල පහත සඳහන් ප්‍රකාශන පහත සඳහන් අර්ථ වලින් සමන්විත වේ :

බලය ලබාදීම (Accreditation) : නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා පුද්ගලයෙක් හෝ ආයතනයක් නිපුණතාවයෙන් හෙබි බවට බලයලත් ආයතනයක් විධිමත්ව හඳුනාගැනීමේ ක්‍රියාවලිය

ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ග (Category of RTTE) (ජංගම දුරකථන (mobile handsets), රැහැන් රහිත රවුටර් (Wireless routers), රැහැන් රහිත අනුකූලතා /රැහැන් රහිත දේශීය ප්‍රදේශ ජාල (wifi/WLAN) ලැප්ටොප් (laptop), ස්ථාවර දුරකථන (fixed telephone), ෆැක්ස් යන්ත්‍ර සමග රැහැන් රහිත සම්බන්ධතා (Fax matching with wireless connection) යනාදී පුද්ගලික පරිහරණය සඳහා වන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පුළුල් පරාසය සම්බන්ධ වන යෙදුමකි.

කොමිෂන් සභාව (Commission) : 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත මගින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

අනුකූලතා ප්‍රකාශනය (Declaration of Conformity - Doc) : අනුකූලතා ප්‍රකාශනය ISO-IEC 17050 : 2014 ප්‍රකාරව ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිෂ්පාදකයකු විසින් නිකුත් කරන ලද නීත්‍යානුකූල ලියවිල්ලක් වන අතර එවැනි ලියවිල්ලක් නිකුත් කිරීමෙන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ එම රීති සහ ප්‍රමිතිවලට අනුකූලවන බවත්, එමෙන්ම නිෂ්පාදකයා ඔවුන් එකී ප්‍රමිති සම්බන්ධ සියලුම පරීක්ෂණ සහ මිනුම් යොදා ගෙන ඇති බව ප්‍රකාශ කරන අතර එවැනි පරීක්ෂණ සහ මිනුම් මගින් සම්මත නිර්දිෂ්ට පරාමිතීන්වලට සම්පූර්ණයෙන් අනුකූල වන බව පෙන්නුම් කර ඇත.

විද්‍යුත් චුම්භක ගැළපුම (Electromagnetic Compatibility -EMC) : විද්‍යුත් චුම්භක ගැළපුම යන්නෙන් විද්‍යුත් චුම්භක පරිසරයට කිසිම ආකාරයක දැරිය නොහැකි විද්‍යුත් චුම්භක අවහිරතාවයක් ඇති කිරීමෙන් තොරව එම පරිසරය තුළ විද්‍යුත් උපකරණ සතුටුදායක ආකාරයෙන් ක්‍රියා කරවීමට ඇති හැකියාව අදහස් වේ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙළඳපලට මුදා හැරීමට පෙර කොමිෂන් සභාව විසින් නියම කරන ලද විද්‍යුත් චුම්භක ගැළපුම් ප්‍රමිති සපුරා ලිය යුතුය.

චුම්භක පුඩු පද්ධතිය (Inductive Loop Systems) : පූර්ව නිශ්චය කරන ලද හඳුනාගත් සංඥාවක් ඇති කිරීමෙන් තොරව පාලනය කළ චුම්භක ක්ෂේත්‍ර තුළ නිෂ්පාදනය කරමින් ක්‍රියා කරවන ගුවන් විදුලි උපකරණ මින් අදහස් වේ. නිදසුන් වශයෙන් නීති විරෝධී ලෙස සාප්පු සොරකම් කිරීමේ සළකුණු පද්ධති (Shop anti - theft tagging systems,) මෝටර් රථ නැවැත්වීමේ යතුරු (Car immobiliser keys) සහ දොර ප්‍රවේශ කාඩ්පත් (door access lookers) ඊට උදාහරණ වේ.

අන්තර් ක්‍රියාකාරිත්වය (Interface) : පොදු විදුලි සංදේශ ජාලයකට ප්‍රවේශ වීමට පරිහරණය කරන්නෙකුට සපයන භෞතිකමය සම්බන්ධතා ලක්ෂ්‍යයක් වන ජාල අවසන් කිරීමේ ලක්ෂ්‍යය සහ/හෝ (ii) ගුවන් විදුලි උපකරණ සහ ඒවායේ තාක්ෂණික පිරිවිතර අතර ගුවන් විදුලි ප්‍රවේශය දක්වන ගුවන් සම්බන්ධකය මින් අදහස් වේ.

අවහිරතාවය (Interference) : කිසියම් කාර්ය සාධනයක අවක්‍රමණය, වැරදි අර්ථකථනය මගින් ප්‍රකාශිත, ගුවන් විදුලි සන්නිවේදන ක්‍රමයක ප්‍රතිග්‍රහණය මත විමෝචන, විකිරණ හෝ චුම්භක ප්‍රේරණයක් හෝ සංයෝජනයක් හේතුවෙන් අනවශ්‍ය ශක්තියේ බලපෑම සහ එවැනි අනවශ්‍ය අවස්ථාවන්හීදී ලබාගත හැකි තොරතුරුවල නැතිවී යාම.

ස්වකීය පරිහරණය (Own use) : කිසියම් තැනැත්තෙකු (තනි හෝ ආයතනික) විසින් ස්වකීය ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ගයකි.

පුද්ගලික පරිහරණය (Personal use) : කිසියම් තැනැත්තෙකු වාණිජමය අරමුණකින් තොරව භාවිත කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ගයකි.

ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (Radio and Telecommunications Terminal/Equipment): ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිත කරමින් නිදහස් අවකාශයේ ගුවන් විදුලි තරංග ව්‍යාප්තිය ප්‍රතිග්‍රහණය සහ/හෝ විමෝචනය කිරීම මගින් සන්නිවේදන කළ හැකි රැහැන් රහිත තාක්ෂණයන් භාවිතා කරන විදුලි සංදේශ උපකරණ.

කෙටි පරාස උපකරණ (Short Range Devices) : කෙටි පරාස උපකරණ යන්නෙන් වෙනත් ගුවන් විදුලි සන්නිවේදන උපකරණවලට බාධාවන් ඇති කිරීමේ අඩු හැකියාවක් ඇති ඒකදිශානුගත හෝ ද්විදිශානුගත සන්නිවේදනය සපයන ගුවන් විදුලි සම්ප්‍රේෂකයන් අදහස් වේ. ඒවා අනුකලන , වෙන් කළ හෝ බාහිර ඇන්ටනා සහිතව භාවිතා කරනු ලබන අතර අදාළ ප්‍රමිතීන්ට යටත්ව සියලුම මූර්ජන ක්‍රම සඳහා අවසර ලබා දෙනු ලැබේ.

තාක්ෂණික ප්‍රමිතිය (Technical Standard) : කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කළ තාක්ෂණික පිරිවිතර හෝ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවලට අදාළ යැයි කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගන්නා ශ්‍රී ලංකාවේ ජාල ක්‍රියාකරුවන් විසින් ප්‍රසිද්ධ කළ අන්තර් ක්‍රියාකාරිත්වය හෝ අන්තර් ක්‍රියාකාරී අවශ්‍යතා ඇතුලුව කොමිෂන් සභාව විසින් හඳුනාගත් වෙනත් තාක්ෂණික අවශ්‍යතා මින් අදහස් වේ.

තාක්ෂණික ඉදිකිරීම් ගොනුව (Technical Construction File) : සම්මත මාදිලි අනුමැති අයදුම්පත්‍රය සඳහා අවශ්‍ය සියලුම තාක්ෂණික ලිපිලේඛන වලින් සමන්විත වාර්තාවකි.

පරීක්ෂණ විද්‍යාගාර (Testing Laboratory): විදුලි සංදේශනය , විද්‍යුත් චුම්භක අනුකූලතාවය , සෞඛ්‍ය සහ ආරක්ෂණය ඇතුලු තාක්ෂණික ප්‍රමිති වලට අදාළ පරීක්ෂණ මෙහෙයවීම සඳහා අදාළ උපකරණ , සැපයුම , සහතිකලත් විශේෂඥයින් ලබා ගන්නා විද්‍යාගාර "පරීක්ෂණ විද්‍යාගාර" වේ.

මාදිලි අනුමැතිය (Type Approval) : කොමිෂන් සභාවේ නියාමන, තාක්ෂණික සහ ආරක්ෂණ නියාමනයන් මාලාව අවම වශයෙන් හෝ සපුරාලන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබා දෙනු ලැබේ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය ශ්‍රී ලංකා වෙළඳපලේ අලෙවි කිරීමට අවසර ලබා දීමට පෙර මාදිලි අනුමැතිය ලබාදීම අවශ්‍යය වේ.

මාදිලි අනුමැති සහතිය: (Type Approval Certificate) : මෙම ලියවිල්ලේ පරිශිෂ්ට ඉ-ස දක්වා ඇති අදාළ ප්‍රමිතීන්ට ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය අනුකූල වන බව සඳහන් කරමින් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලියවිල්ලකි.

වෙළෙඳ බලපත්‍රය (Vendors license) : දේශීය වෙළෙඳපලේ විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ විකිණීම සඳහා පනතේ 21 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයකි.

**06. කෙටි යෙදුම්**

අනුකූලතා ප්‍රකාශනය
DOC : Declaration of Conformity

ඵලදායී සමස්ථානික විකිරණ බලය
EIRP : Effective Isotropic Radiated Power

විද්‍යුත් චුම්භක අනුකූලතාවය
EMC : Electromagnetic Compatibility

යුරෝපීය විදුලි සංදේශ ප්‍රමිති ආයතනය
ETSL : European Telecommunications Standards Institute

ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිෂන් සභාව
IEC : International Electrotiechnical Commission

ජාත්‍යන්තර විද්‍යාගාර ප්‍රතීතන සංස්ථාව
ILAC : International Laboratory Accreditation Cooperation

ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංගමය
ISO : International Organization for Standardization

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය
ITU : International Telecommunications Union

ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව
NFAT : National Frequency Allocation Table

මුද්‍රිත පරිපථ පුවරුව
PCB : Printed Circuit Board

ගුවන් විදුලි ප්‍රවේශ ජාල
RAN : Radio Access Network

ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ
RTTE : Radio and Telecommunications Terminal Equipment

තාක්ෂණික ඉදිකිරීමේ ගොනුව
TCF : Technical Construction File

භෞමික දිගුදුර ගුවන් විදුලි
TETRA : Terrestrial Trunked Radio

**7. පරිශිෂ්ටයන්**

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල කොටසක් වශයෙන් සැලකෙන VII කොටසේ පහත සඳහන් පරිශිෂ්ට ආශ්‍රයෙන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති කියැවේ.

| | | |
|---|---|---|
| ඇමුණුම අ | - | සම්මත මාදිලි අනුමැති ආකෘති පත්‍රය |
| ඇමුණුම ආ | - | සරල මාදිලි අනුමැති අයදුම් පත්‍රය |
| පරිශිෂ්ටය ඇ | - | අනුකූලතා ප්‍රකාශනය සකස් කිරීම සඳහා උපදෙස් |
| පරිශිෂ්ටය ඈ | - | මාදිලි අනුමැතිය සහ වෙනත් අදාළ ගාස්තු |
| පරිශිෂ්ටය ඉ | - | ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති ප්‍රමිති |
| පරිශිෂ්ටය ඊ | - | මාදිලි අනුමැති සහතිකය |
| පරිශිෂ්ටය උ | - | මාදිලි අනුමැති ලේබල |
| පරිශිෂ්ටය ඌ | - | මාදිලි අනුමැතිය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආදර්ශක නියැදි(ය) ආනයන කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය එ | - | මාදිලි අනුමැතිය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආදර්ශක නියැදි (ය) සඳහා රේගු නිෂ්කාශනය ලබා ගැනීම් අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඒ | - | වාණිජමය අරමුණු සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිළිබඳ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඔ | - | වාණිජමය අරමුණු සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල රේගු නිෂ්කාශනය ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය ඕ | - | පුද්ගලික පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා රේගු නිෂ්කාශනය ලබා ගැනීමේ අයදුම්පත්‍රය |
| පරිශිෂ්ටය | - | ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ප්‍රති අපනයනය කිරීමට අවසර ලබා ගැනීමේ අයදුම්පත්‍රය |

## III කොටස : මාදිලි අනුමැතිය සඳහා අයදුම් කිරීමේ පටිපාටිය

**8. මාදිලි අනුමැති අයදුම්පත්‍රය**

(1) අදාළ මාදිලි අනුමැති වර්ග සඳහා නියමිත ආකෘති පත්‍රය භාවිතා කරමින් මාදිලි අනුමැතිය සඳහා අයදුම්පත සකස් කර ගත යුතු අතර එම ආකෘතිපත්‍රය පරිශිෂ්ඨ අ සහ පර්ශිෂ්ඨ ආ හි දැක්වේ. අයදුම්පතේ විද්‍යුත් පිටපතක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

(2) ශ්‍රී ලංකාව තුළ අළෙවි කිරීමට අපේක්ෂා කරන සෑම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ගයක් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එක් අයදුම් පත්‍රයක් මගින් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල එක් විශේෂ මාදිලියක් සහ / හෝ වෙළඳ නාමයක් පමණක් ආවරණය වේ.

(3) මෙම රීති ප්‍රකාරව මාදිලි අනුමැතිය සඳහා අයදුම් කිරීමට සුදුසුකම්ලත් පාර්ශ්වයන් පහත දැක්වේ.

(අ) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම සඳහා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය යටතේ නිකුත් කළ වලංගු වෙළඳ බලපත්‍රයක් හිමි සංවිධාන /ආයතන

(ආ) කොමිෂන් සභාවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු ස්වකීය පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් (පුද්ගලයන් / සංස්ථාපිත ආයතන/ නිෂ්පාදකයන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්)

**(9) අයදුම්පත් ක්‍රියාවලිය**

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල මාදිලි අනුමැතිය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවකු පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. එනම්:

(අ) සම්මත මාදිලි අනුමැතිය-කොමිෂන් සභාව විසින් මීට පෙර මාදිලි අනුමැතිය ලබා නොගත් ඕනෑම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක් සඳහා සම්මත මාදිලි අනුමැති ක්‍රියාවලිය යොදා ගත යුතුය.

(ආ) සරල මාදිලි අනුමැතිය-සරල මාදිලි අනුමැති ක්‍රියාවලිය ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා දැනටමත් කොමිෂන් සභාව විසින් මාදිලි අනුමැතිය ලබා දී ඇති අවස්ථාවක යොදා ගත යුතුය.

(2) අදාළ මාදිලි අනුමැතිය සඳහා ගාස්තු ගෙවූ බවට සාක්ෂි සහිතව 10 සහ 11 වගන්තිවල සඳහන් අවශ්‍ය සියලුම ආධාරක ලිපි ලේඛන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන තෙක් මාදිලි අනුමැතිය පිළිබඳ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබේ. මාදිලි අනුමැතිය ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි හැඟෙන යම් වෙනත් අමතර තොරතුරු ඉදිරිපත් කිරීම ද මෙයට ඇතුළත් විය හැකිය.

(3) මාදිලි අනුමැති ක්‍රියාවලියේ ගැලීම් සටහන පහත 1 රූප සටහනේ දැක්වේ.




(1) රූප සටහන - මාදිලි අනුමැති ක්‍රියාවලිය

(4) ඉල්ලා සිටින තොරතුරු අසම්පූර්ණවීම හෝ අනුකූල නොවීම හෝ මෙම රීති වලට අනුකූලව කටයුතු කිරීමට අයදුම්කරු අපොහොසත් වීමේ ප්‍රථිපලයක් වශයෙන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති රීති යටතේ ඉදිරිපත් කරන අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ බලය කොමිෂන් සභාව සතුවේ. එලෙස අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී , මාදිලි අනුමැති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. කෙසේවුවද, අයදුම්කරුට අනුකූල නොවීම පිළිබඳව විමසා බලා, සුදුසු පරිදී මාදිලි අනුමැතිය සඳහා නව අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට හැකිය.

(5) කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම තොරතුරු රහස්‍ය සේ සැලකෙන අතර තෙවන පාර්ශවයන් වෙත අනාවරණය කරනු නොලැබේ.

(6) සම්පූර්ණ කරන ලද මාදිලි අනුමැති අයැදුම්පත අදාල සියලුම ලියකියවිලි සහ මාදිලි අනුමැති යෝජනා ක්‍රමය ප්‍රකාරව අදාල අයදුම්පත් ගාස්තු සහිතව පහත සඳහන් ලිපිනයට භාරදීම හෝ තැපෑලෙන් එවිය යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
276, ඇල්විටිගල මාවත,
කොළඹ 08

## IV කොටස : මාදිලි අනුමැති පාලනය

### 10. සම්මත මාදිලි අනුමැතිය

(1) මෙම රීතිවල (අ) පරිශිෂ්ටයේ දක්වා ඇති නියමිත අයදුම්පත භාවිතා කරමින් සම්මත මාදිලි අනුමැතිය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

(2) සම්මත මාදිලි අනුමැති ක්‍රියාවලිය යටතේ මාදිලි අනුමැතිය සඳහා අයදුම්පතත් ක්‍රියාත්මක කිරීමේ කාලය, සම්පූර්ණ කරන ලද අයදුම්පත් කට්ටලය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ දින සිට වැඩකරන දින 30ක කාලයක් දක්වා වේ.

(3) අදාළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක ආකෘතිමය සාම්පලයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. මාදිලි අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීම සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සාම්පල ඒකක දෙකක් තෙක් ඉල්ලා සිටීමේ අයිතිය කොමිෂන් සභාව සතු වේ.

(4) සම්මත මාදිලි අනුමැතිය සඳහා අයදුම්පත්‍රය තාක්ෂණික නිෂ්පාදන ගොනුවක් (Technical Construction File) මගින් ඉදිරිපත් කළ යුතුය. තාක්ෂණික නිෂ්පාදන ගොනුවේ (TCF) සියලුම අදාළ පරීක්ෂණ වාර්තා සහ කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ප්‍රමිතීන්ට ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වල අනුකූලතාවය පෙන්නුම් කරන වෙනත් අදාළ ලියකියවිලි අන්තර්ගත වේ. තාක්ෂණික නිෂ්පාදන ගොනුවේ (TCF) ආකෘතිය විවිධ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීම පිණිස අනුගත වන නමුත් එය ආකෘතිය හා ISO/ IEC 17050-2: 2004 හි සෙසු අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. තාක්ෂණික නිෂ්පාදන ගොනුව (TCF) මගින් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල සැලැස්ම, නිෂ්පාදනය සහ ක්‍රියාකාරිත්වය ආවරණය කළ යුතු අතර පහත සඳහන් දෑ ඇතුළත් කළයුතුය.

(අ) අනුකූලතා ප්‍රකාශනය (The Declaration of Conformity - DOC) : අනුකූලතා ප්‍රකාශනය (DOC) යනු ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිෂ්පාදකයා විසින් සමාගම් ලිපි ශීර්ෂය මත සකස් කර ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය ශ්‍රී ලංකාවට අදාළ තාක්ෂණික පිරිවිතරයන්ට (ගුවන් විදුලි, සෞඛ්‍ය ආරක්ෂණ සහ විද්‍යුත් චුම්භක ගැලපුම - EMC) අනුකූල බව සහතික කරමින් සමාගමේ බලය ලත් නියෝජිතයෙකු විසින් අත්සන් කරන ලද ලියවිල්ලකි. තාක්ෂණික නිෂ්පාදන ගොනුවේ (TCF) අනුකූලතා ප්‍රකාශනය ISO/IEC 17050-1:2004 ප්‍රමිති ප්‍රකාරව සකස් කර පවත්වා ගත යුතුය.

අනුකූලතා ප්‍රකාශනය (DOC) පරිශිෂ්ට (ඇ) හි දක්වා ඇති විධිවිධාන සහ උපදෙස් (ISO/IEC/7090 - 1: 2004 ප්‍රමිති පදනම් කරගෙන) වලට අනුකූලව සකස් කළ යුතුය.

(ආ) පටුන හෝ අන්තර්ගතය ;

(ඇ) පරිහරණය කරන්නාට ඉදිරිපත් කරන පරිදි උපකරණයේ අපේක්ෂිත භාවිතය සහ අනුකූලතාවයට අදාළ සියලුම නිශ්චිත ස්ථාපන තොරතුරු පිළිබඳ පැහැදිලි කිරීමක් ඇතුලුව ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ පිළිබඳ කෙටි තාක්ෂණික විස්තරයක් ;

(ඈ) අදාළ ගුවන් විදුලි සන්නිවේදන ජාල සහ සියලුම ජාත්‍යන්තර ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි භාවිතයන් හඳුනා ගැනීම;

(ඉ) සියලුම ජාල ක්‍රියාකාරිත්වයන්ට බලපෑම් ඇති කළ හැකි හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන මත බලපෑමක් ඇති කරන මෘදුකාංග සහ ස්ථර මෘදුකාංග (නිතර භාවිතා වන මෘදුකාංග) හඳුනා ගැනීම.

(ඊ) තාක්ෂණික අවශ්‍යතාවයන්ට අනුකූලවීම කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) කොටස් වල පරිපථ රූප සටහන් මෙන්ම මුද්‍රිත පරිපථ පුවරු මෙන්ම (Printed Circuit Board - PCB) ඊට නිදසුන් වශයෙන්, ජාල සම්බන්ධතා පරිපථ සහ ගුවන් විදුලි සම්බන්ධක (ඇන්ටනා හෝ ඇන්ටනා සඳහා සම්බන්ධ කිරීමේ ඒකක), සජීවී කථන උපකරණවල ශ්‍රව්‍ය උපාංග, මාර්ග සංඥා වෙනත් උපකරණ සම්බන්ධ කිරීමේ සොකටය (කෙවණිය), බල සැපයුම් සහ සියළුම ජාලවලට බලපාන මූලිකාංග.

(උ) නිෂ්පාදිතයේ අභ්‍යන්තර හා බාහිර එකලස් කිරීම යන දෙකෙහිම ඡායාරූප මාදිලි අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද නිෂ්පාදිතයට සමාන බව නිශ්චය කර පුද්ගලයෙකුට අවසර දීමට ප්‍රමාණවත් බව.

(ඌ) උපකරණය කාරක උපකරණය ස්ථාපනය කිරීමේ සම්බන්ධක කාඩ්පතක් හෝ මොඩියුලයක් නම්, නිශ්චය කළ යුතු අනුකූල කාරකයක් සඳහා වන ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් විස්තරයක් ලබාදිය යුතුය.

(එ) උපකරණය දත්ත කේතවලට හැරවීමේ පද්ධතිවලට සහාය වේ නම්, නිෂ්පාදකයා විසින් දත්ත කේතවලට හැරවීමේ මාදිලිවල විස්තර ඉදිරිපත් කළ යුතුය.

(ඒ) මෙම රීතිවල 14 වන වගන්තියේ වඩා විස්තර කරන ලද කොමිෂන් සභාව විසින් පිළිගත් සහතික ලත් පරීක්ෂණ විද්‍යාගාර විසින් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තා ප්‍රකාරව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දක්වා ඇති අදාල ප්‍රමිති සමග ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය (RTTE) අනුකූල වන බවට පැහැදිලි කළ යුතුය.

(i) පරිහරණය කරන්නාගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම;
(ii) ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ඵලදායී ලෙස භාවිතා කිරීම;
(iii) විද්‍යුත් චුම්භක අනුකූලතාවය .

(ඔ) පරීක්ෂණ වාර්තාවක් වලංගු වන්නේ අනුමැතිය ඉල්ලා සිටින ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය වෙනුවෙන් එය සකස් කර ඇත්නම් සහ පරීක්ෂණ වාර්තාව සම්පූර්ණ කිරීමෙන් පසුව ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයේ (RTTE) කිසිදු නවීකරණයක් කර නොමැති නම් පමණි.

(5) කොමිෂන් සභාවට අවශ්‍ය යැයි හැඟෙන විටෙකදී අමතර අදාල ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

(6) මාදිලි අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද සාම්පලය වෙළඳපොලේ පවත්නා ගුවන් විදුලි සහ විදුලිසංදේශ පර්යන්ත උපකරණයට (RTTE) සමාන බව තහවුරු කර ගැනීම සඳහා පරිශිෂ්ට (ඉ) හි 4 සහ 5 වගුවල ඇතුලත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සාම්පල් හැරුණු විට , මාදිලි අනුමැති අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන ලද සාම්පල් වසර දෙකක (02) කාලයක් සඳහා රඳවා ගනු ලැබේ. ඇතැම් මාදිලි අනුමැති පරීක්ෂණ හානිදායක වන බැවින්, එම සාම්පලය නැවත ප්‍රශස්ත ක්‍රියාකාරී තත්ත්වයෙන් ආපසු ලබාදීමට කොමිෂන් සභාව සහතික නොවේ.

**11. සරල මාදිලි අනුමැතිය**

(1) මෙම රීතිවල පරිශිෂ්ට (ආ) හි දක්වා ඇති නියමිත අයදුම්පත භාවිතා කරමින් සරල මාදිලි අනුමැතිය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

(2) අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කොමිෂන් සභාවේ මාදිලි අනුමැති නාමලේඛනයේ දක්වා ඇති ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා සරල මාදිලි අනුමැතිය අදාළ වේ. මාදිලි අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය මාදිලි අනුමැති ලේඛනයේ දැනටමත් දක්වා ඇති හා දැනටමත් මාදිලි අනුමැතිය ලබාගත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවලට සමාන බව අයදුම්කරු විසින් සහතික කළ යුතුය.

(3) මෙම සරල මාදිලි අනුමැති ක්‍රියාවලියේදී පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ; කෙසේවුවද, ඒ සඳහා ආදර්ශක සාම්පලයක් අවශ්‍ය වනු ඇත.

(4) සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගොනුව ලැබී වැඩ කරන දින දහයක් (10) ඇතුළත සරල මාදිලි අනුමැති අයදුම්පත්‍ර ක්‍රියාවලිය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වේ.

12. මාදිලි අනුමැති ගාස්තු

1. මාදිලි අනුමැති අයදුම්පත් සහ වෙළඳපල ආවේක්ෂණය තක්සේරු කිරීම ඇතුලුව, මාදිලි අනුමැති ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් දරන පරිපාලන වියදම් ආවරණය කිරීම මාදිලි අනුමැති ගාස්තු වලින් අපේක්ෂා කෙරේ.

2. මාදිලි අනුමැති ගාස්තු ආපසු නොගෙවනු ලබන අතර අයැදුම්කරු විසින් මාදිලි අනුමැති ගාස්තු කල්තියා ගෙවිය යුතුය.

3. මාදිලි අනුමැති අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී නියමිත මාදිලි අනුමැති ගාස්තුව ගෙවිය යුතු අතර මාදිලි අනුමැති ගාස්තු ගෙවූ බවට සාක්ෂි අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. මෙම රීතිවල පරිශිෂ්ට 'ඇ' හි දක්වා ඇති පරිදි සෑම ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) වර්ගයකටම මාදිලි අනුමැති ගාස්තු අය කරනු ලැබේ.

4. විවිධ කාණ්ඩවලට අයත් උපකරණ සඳහා මූලික මාදිලි අනුමැති උපලේඛනය හා වෙනත් අදාල ගාස්තු මෙම රීතිවල ඇ පරිශිෂ්ටයේ දක්වා තිබේ. කොමිෂන් සභාවට අවශ්‍ය පරිදි කලින් කල මාදිලි අනුමැති ගාස්තු සමාලෝචනය කළ හැකිය.

13. මාදිලි අනුමැති ප්‍රමිති

1. කොමිෂන් සභාව පොදුවේ පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්, සම්මුති සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම් සහ බැඳීම්වලට අනුකූලව ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා අදාළ වන මාදිලි අනුමැති ප්‍රමිතීන්වල එදිනෙදා සංශෝධන ඇති කිරීම සහ ඒවා ප්‍රසිද්ධ කිරීම.

2. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) පිළිබඳ මාදිලි අනුමැති ප්‍රමිති වල මූලික කරුණු මෙම මාදිලි අනුමැති රීතිවල (ඉ) පරිශිෂ්ටයේ සඳහන් වේ. ශ්‍රී ලංකාව තුළ භාවිතා කිරීමට අපේක්ෂිත ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) වලට අදාළ පිරිවිතර සහ මාදිලි අනුමැති ප්‍රමිති (ඉ) පරිශිෂ්ටයේ ලැයිස්තුගත කරනු ලැබේ.

3. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීම සහ විද්‍යුත් චුම්බක අනුකූලතාවය (EMC) හෝ භෞතික අන්තර් මෙහෙයුම් වල (දෘශ්‍ය විද්‍යුත් හෝ ගුවන් විදුලි පද්ධති ) ආරක්ෂාව සහතික කිරීම සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ප්‍රමිති (RTTE) වර්ගීකරණය කළ යුතුය. මාදිලි අනුමැති ප්‍රමිතීන් මගින් උපකරණ කාර්ය සාධනය හෝ ගුණාත්මකභාවය පිළිබඳ කරුණු සාකච්ජා නොකෙරේ.

4. පහත දැක්වෙන ජාත්‍යන්තර ප්‍රමිතීන් පදනම් කරගත් පරිශිෂ්ට 'ඉ' හි ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති ප්‍රමිති සඳහා පහත සඳහන් ජාත්‍යන්තර ප්‍රමිතීන් පදනම් කරගනු ලැබේ.

අ. යුරෝපීය විදුලි සංදේශ ප්‍රමිති ආයතනය (ETSI) ;
ආ. ජාත්‍යන්තර විද්‍යුත් - තාක්ෂණ කොමිෂන් සභාව (IEC) ;
ඇ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU).

5. අදාළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති ප්‍රමිති නොමැති විට, අදාළ ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා අනුමැතිය ලබාදීය හැකිද යන්න එක් එක් සිද්ධිය පදනම් කරගෙන කොමිෂන් සභාව විසින් තීරණය කළ යුතුය.

(අ) අපේක්ෂා කරන ලද පරිදි ක්‍රියාකරවීමට නොහැකි ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) හෝ වෙනත් උපකරණ ඉහළ මට්ටම ඉක්මවා යන විද්‍යුත් චුම්භක අවහිරතාවයන් උත්පාදනය නොකරන බව ;

(ආ) එහි අපේක්ෂිත භාවිතයේදී අපේක්ෂා කළ යුතු විද්‍යුත් චුම්භක අවහිරතාවයන් වැළැක්වීමේ හැකියාවක් ඇති අතර එමගින් එහි භාවිතයේදී පිළිගත නොහැකි අවක්‍රමණ වලින් තොරව උපකරණය ක්‍රියාකරවීමට ඉඩ සලසන බව ;

(ඇ) ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව භාවිතා කිරීම.

**14. පිළිගත් පරීක්ෂණ විද්‍යාගාර**

(1). අයදුම්කරුවන් විසින් පරීක්ෂණ ප්‍රතිඵල ඉදිරිපත් කළ යුත්තේ මාදිලි අනුමැතිය සඳහා කොමිෂන් සභාව විසින් පිළිගත් බලයලත් පරීක්ෂණ විද්‍යාගාරවලින් පමණි. පරීක්ෂණ වාර්තාවේ දිනය අයදුම්කරන දිනයට මාස තුනකට වඩා පැරණි නොවිය යුතුය. බලය නොලත් විද්‍යාගාර මගින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා පිළිගනු නොලැබේ.

(2) පහත සඳහන් කොන්දේසි සපුරාලන පරීක්ෂණ විද්‍යාගාරයක් විසින් සිදු කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵල කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ:

(අ) ISO/IEC/17025ට අනුකූල විද්‍යාගාර

(ආ) ජාත්‍යන්තර රසායනාගාර නීතිගත කිරීමේ සංස්ථාවේ (ILAC) සාමාජිකයෙකු වන ප්‍රතීතන ආයතනයක් විසින් සහතික කරන ISO/IEC/17025 අනුකූලවීම. ජාත්‍යන්තර රසායනාගාර නීතිගත කිරීමේ සංස්ථාවේ (ILAC) සාමාජික බලයලත් ආයතනවල ලේඛනයක් http: //ilac.org/ilac-mwmbership/members by economy/වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

**15. මාදිලි අනුමැති සහතිකය**

(1) නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත සලකා බැලීම මත කොමිෂන් සභාව විසින් මාදිලි අනුමැති සහතිකයක් නිකුත් කළ යුතුය. ඉන් පසුව කොමිෂන් සභාවේ මාදිලි අනුමැති නාම ලේඛනයේ අනුරූපී සටහන් ඇතුළත් කරනු ලැබේ. මාදිලි අනුමැති සහතිකයේ ආකෘති පත්‍රයක් පරිශිෂ්ට ඊ හි දක්වනු ලැබේ.

(2) කොමිෂන් සභාව විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු ලිපියක් මගින් සියලුම අසමර්ථ වූ අයදුම්කරුවන්ට දැනුම් දිය යුතුය.

**16. මාදිලි අනුමැති ලේඛනය**

(1) ශ්‍රී ලංකාවේ ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, විකිණීම සහ භාවිතා කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මාදිලි අනුමැතිය ලබා දුන් සියලුම මාදිලි අනුමැති ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) පිළිබඳ විස්තරාත්මක තොරතුරු (මාදිලිය, මෝස්තරය, ස්වරූපය, ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයේ (RTTE) විස්තර, මාදිලි අනුමැති අංකය, මාදිලි අනුමැතිලාභියාගේ නම යනාදිය) මාදිලි අනුමැති ලේඛනයේ ඇතුළත් කළ යුතුය. මාදිලි අනුමැති ලේඛනය මහජනතාවට කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිවේ.

මාදිලි අනුමැති ලේඛනයේ පහත තොරතුරු ඇතුළත් විය යුතු නමුත් එම ලේඛනය මෙම කරුණුවලට පමණක් සීමා නොවනු ඇත:

අ. සමාගම, සංවිධානය, ආයතනය, තනි පුද්ගල යනාදිය
ආ. උපකරණයේ වර්ගය
ඇ. මෝස්තරය/මාදිලිය/ස්වරූපය
ඈ. නිෂ්පාදකයා
ඉ. නිෂ්පාදිත රට
ඊ. සංඛ්‍යාත පරාසය
උ. විමෝචන විස්තර
ඌ. සංඛ්‍යාත පරාසය සහ සංඛ්‍යාත අවකාශය
එ. මූර්ජන වර්ගය
ඒ. බල සැපයුම
ඔ. ඵලදායී සමස්ථානික විකිරණ බලය (EIRP)

(2) එමෙන්ම මාදිලි අනුමැතිය අවලංගු කරන ලද සහ මාදිලි අනුමැතිය ලබාදීමෙන් නිදහස් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) පිළිබඳ ලේඛනය මහජනතාවගේ සහ විදුලි සංදේශ කර්මාන්තයේ දැන ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

(3) මාදිලි අනුමැති ලේඛනයේ තොරතුරු ලබාගනු ලබන්නේ අයදුම්කරු විසින් මාදිලි අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත මගිනි. අයදුම්කරු විසින් මෙම තොරතුරුවල නිරවද්‍යතාව සඳහා වගකිව යුතුය.

**17. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) වෙනස් කිරීම්.**

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) නිෂ්පාදන වෙළඳ නාමය, උපකරණයේ නම,වර්ගය, ස්වරූපය, සැලැස්ම හෝ ක්‍රියාකාරිත්වය වෙනස් කරන ඕනෑම අවස්ථාවකදී ඒ බව වහාම කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතුය.

(2) පහත සඳහන් අවස්ථාවලදී මෙම රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුකූලව මාදිලි අනුමැතිය සඳහා නව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය ඃ

(අ) දැනටමත් මාදිලි අනුමැතිය ලත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක් සම්බන්ධයෙන් මාදිලි අනුමැති ලේඛනයේ හෝ අනුකූලතා ප්‍රකාශනයේ වාර්තාගත කිසියම් තොරතුරකට බලපාන වෙනස්කමක් හෝ නිෂ්පාදිත වෙළඳ නාමය, උපකරණයේ නම, වර්ගය, ස්වරූපය, සැලැස්ම හෝ ක්‍රියාකාරිත්වයේ වෙනස්කම් සිදුකිරීම,

(ආ) මාදිලි අනුමැතිය ලත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) වෙනස්කම් සිදු කිරීම මීට පෙර පරීක්ෂා කරන ලද හා වලංගුව පැවති අදාළ ප්‍රමිති සහ නියමයන්වල අනුකූලතාවයට බලපෑ හැකිය,

(ඇ) මාදිලි අනුමැතිය ලත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) වෙනස් කිරීම් කරන විටෙකදී, ජාල අන්තර් ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කිරීම හෝ අදාළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල ආරක්ෂාව, විද්‍යුත් චුම්භක අනුකූලතාවය හෝ අදාළ ගුවන් විදුලි සංඛ්‍යාත හැසිරීම සම්බන්ධ විශේෂ අත්‍යවශ්‍ය නියමයන් මත බලපෑමක් ඇති කළ හැකිය.

(3) මාදිලි අනුමත කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) හැඩයේ අවශ්‍ය වෙනස්කම් සිදු කරන්නේ නම්, මෙහෙයුම් සංඛ්‍යාත, ආරක්ෂාව, විද්‍යුත් චුම්භක අනුකූලතාවය සම්බන්ධ විශේෂයෙන් අත්‍යාවශය නියමයන්වලට කිසියම් බලපෑමක් හෝ විදුලි සංදේශ ජාලයේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇති නොකළ යුතු අතර අදාළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයේ (RTTE) පවත්නා මාදිලි අනුමැතිය එලෙසම නොවෙනස්ව පවත්වා ගත යුතුය.

## V කොටස ඃ නියාමන රාමුව

**18. ලේබල් කිරීම**

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) පිළිබඳව පාරිභෝගිකයන්ගේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව කොමිෂන් සභාව අනුමත කරන ලද තාක්ෂණික ප්‍රමිති සහ නියමයන්වල අනුකූලතාවය සඳහන් කරමින් ශ්‍රී ලාංකීය වෙළෙඳපළට සපයන මාදිලි අනුමත කළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මත විශේෂ මාදිලි අනුමැති අංකයක් සහ ලේබලයක් ඇලවීමේ ක්‍රියාවලිය ලේබල් කිරීම වේ.

(2) පරිශිෂ්ට "ඈ" හි දක්වා ඇති පරිදි නියමිත ගාස්තුවක් ගෙවීමෙන් පසු මුද්‍රිත ලේබල් කොමිෂන් සභාවෙන් ලබා ගත යුතුය. ලේබල් සඳහා වන මිල මාදිලි අනුමැති ගාස්තුවලට අමතර වශයෙනි. ලේබලයේ ආකෘතියක් මෙම රීතිවල පරිශිෂ්ට "උ" හි දැක්වේ.

(3) මාදිලිය අනුමත කරන ලද සියලුම ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල ඇසුරුම මත ස්ථිරවම අලවන ලද ලේබලයක් තිබිය යුතුය.

(4) කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කළ නිෂ්පාදනවල ප්‍රමිතිය හෝ කල්පැවැත්ම පිළිබඳව කොමිෂන් සභාව විසින් කිසිම වගකීමක් නොගත යුතුය.

(5) කූට ලෙස සකස් කළ ලේබලයක් අලවන ලද බවට අනාවරණය වූ වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය කොමිෂන් සභාව සතුවේ.

**19. පිරික්සීම සහ ආවේක්ෂණය**

(1) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) නිෂ්පාදනය, ආනයනය, සැපයීම සහ විකිණීමේ නිරතවන්නන් ඔවුන් කටයුතු කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල (RTTE) මාදිලි අනුමැති නියමයන් සහ අදාළ තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(2) ශ්‍රී ලංකාවේ මාදිලි අනුමත කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) පමණක් අලෙවි කරන බව සහතික කිරීම සඳහා කොමිෂන් සභාව කලින් කල වෙළඳපළ ආවේක්ෂණ ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. එවැනි ආවේක්ෂණ ක්‍රියාකාරකම් පැමිණිල්ලක, අවහිරතාවයන් පිළිබඳ වාර්තාවක,සිල්ලර අලෙවිසැලක ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සම්බන්ධ දෘශ්‍ය පරීක්ෂාවක, නුසුදුසු ප්‍රචාරණයක හෝ සරල නියැදි පරීක්ෂාවක ප්‍රතිඵලයක් විය හැකිය.

(3) ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණ පරීක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාවේ බලයලත් නිලධාරීන්ට ආනයනකරුගේ, නිෂ්පාදකයාගේ, සැපයුම්කරුගේ පරිශ්‍රයට හෝ ගබඩාව, අලෙවිසැල සහ ප්‍රදර්ශනාගාර යන වෙළෙඳ ස්ථානවලට ඕනෑම සාධාරණ කාලසීමාවක් තුළදී ඇතුල්වීමට අවසර ලබා දිය යුතුය.

(4) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) අදාළ තාක්ෂණික පිරිවිතරවලට අනුකූල නොවන බව අනාවරණය කර ගන්නා අවස්ථාවකදී, කොමිෂන් සභාව වෙළඳපළෙන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) ඉවත් කිරීමට සුදුසු පියවර ගැනීම හෝ කොමිෂන් සභාව විසින් අවශ්‍යය යැයි හැඟෙන පරිදි වෙනත් බලාත්මක ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලැබේ.

(5) ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) ආනයනකරුවන්, සැපයුම්කරුවන්, හෝ විකුණුම්කරුවන් එවැනි ක්‍රියාකාරකම්වලදී කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර, එහි උපකරණ හෝ එහි සාම්පල ඒකක සැපයිය යුතු අතර සහ/හෝ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ප්‍රමාදයකින් හෝ පිරිවැයකින් තොරව කොමිෂන් සභාව වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. පරීක්ෂණ අවසානයේදී හිමිකරු වෙත සාම්පල් ආපසු භාර දෙනු ලැබේ.

(6) කොමිෂන් සභාව පිරික්සුම් සහ ආවේක්ෂණ ක්‍රියාකාරකම්වලින් ලබාගත් තොරතුරු සිය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කළ යුතුය.

**20. මාදිලි අනුමැතියෙන් නිදහස් වීම**

(1) පහත සඳහන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සහ භාවිතා කිරීම සඳහා මාදිලි අනුමැතිය ලබා ගැනීමෙන් නිදහස් වන අතර පරිශිෂ්ට "ඉ" හි නියම කර ඇති පරිදි ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සපුරාලිය යුතු අදාළ තාක්ෂණික පිරිවිතර සපයා ඇත.

(අ) රූපවාහිනී දුරස්ථ පාලක, ගරාජ් දොර විවෘතකරණ ඇතුළු කෙටි පරාස අධෝරක්ත දුරස්ථ පාලක උපකරණ,
(ආ) WiFi, Bluetooth වැනි කෙටි පරාස ගුවන් විදුලි තාක්ෂණයන් භාවිතා කරන ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප්වල අන්තර් කරනු ලබන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE),
(ඇ) 50 mw ට වඩා අඩු ප්‍රතිදාන බලය සහිත සම්ප්‍රේෂක උපකරණ,
(ඈ) WiFi, Bluetooth වැනි කෙටි පරාස තාක්ෂණයන් භාවිතා කරන මෝටර් රථ සංචලන ඒකක, දුරස්ථ මෝටර් රථ යතුරු වැනි එහි කොටසක් වශයෙන් වාහනයක සවි කරනු ලබන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE),
(ඉ) 28 වන වගන්තිය යටතේ කිසියම් පුද්ගලයෙකු විසින් සිය පෞද්ගලික පරිහරණය සඳහා මෙරටට රැගෙන එනු ලබන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE).

**21. මාදිලි අනුමැතියේ වලංගුභාවය සහ යාවත්කාලීන කිරීම.**

(1) කිසියම් නිශ්චිත ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා මාදිලි අනුමැතිය වසර හතරක (4) කාලයක් සඳහා වලංගු වන අතර මෙහෙයුම් සංඛ්‍යාත පරාස ඇතුළු සමාන තාක්ෂණික පිරිවිතර පවත්වාගෙන යන මාදිලි අනුමැතියලත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) (වෙළෙඳපළට සපයන) ඉදිරිපත් කළ යුතුය.

(2) අයදුම්කරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මාදිලි අනුමැතිය අළුත් කිරීමකට සහ කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි වෙනත් නියමයන් සහ කොන්දේසිවලට (ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ රීති උල්ලංඝනය කිරීම, පාරිභෝගික පැමිණිලි යනාදිය වැනි) යටත් වේ. මාදිලි අනුමැතිලාභියා විසින් අදාළ මාදිලි අනුමැති වර්ගීකරණය සඳහා පරිශිෂ්ට "අ" සහ "ආ" හි නියමිත අයදුම්පත්‍රය භාවිතා කරමින් මාදිලි අනුමැති සහතිකය කල් ඉකුත්වීමට අවම වශයෙන් දින 60 කට පෙර මාදිලි අනුමැතිය අළුත් කිරීම සඳහා අයදුම් කළ යුතුය. මාදිලි අනුමැතිලාභියා නියමිත දිනයට පෙර මාදිලි අනුමැතිය අළුත් කිරීම සඳහා අයදුම්කිරීමට අපොහොසත් වන්නේනම් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීමට කිසිදු අවසරයක් ලබා දෙනු නොලැබේ.

22. පැවරීම

1. කොමිෂන් සභාවේ පැහැදිලි අවසරයකින් තොරව මාදිලි අනුමැතීන් වෙනත් පාර්ශවයකට පැවරිය නොහැක. පවරන අවස්ථාවක දී, නව අයදුම්කරු අදාළ ලියකියවිලි පරිශීලනය කිරීම ඇතුළුව අනුකූලතා ප්‍රකාශනය නිකුත් කරන පාර්ශවයේ අවශ්‍ය සහය ලබා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙල යොදා ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත් විය යුතුය.

23. අන්තර් කාලීන විධිවිධාන

(1) මෙම රීතිවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සඳහා රීති සම්පාදනය කිරීමට පෙර නිකුත් කළ මාදිලි අනුමැති අවසරය මාස හයක (06) කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වේ. මාදිලි අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්නා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නව සැලැස්ම අදාළ කරගත යුතු වේ.

(2) නව සැලැස්ම ක්‍රියාත්මක වන දින සිට මාස 06 ක කාලයක් සඳහා බලපවත්වන පරිදි නව සැලසුම් කාල පරිච්ඡේදයේදී පැවති මාදිලි අනුමැතිය යටතේ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීමට හෝ විකිණීමට වෙළඳ බලපත්‍රලාභීන්ට අවසර ලැබේ.

24. මාදිලි අනුමැතිය අවලංගු කිරීම (ප්‍රත්‍යාදිෂ්ට කිරීම)

කිසියම් විශේෂිත ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක මාදිලි අනුමැතිය පහත සඳහන් අවස්ථාවලදී අවලංගු කරනු ලැබේ.

*අ.* ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැතිලාභියාගේ ඉල්ලීම පරිදි ;

*ආ.* කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ඕනෑම තොරතුරක් හෝ ආකෘතිමය සාම්පලයක් ව්‍යාජ හෝ අසත්‍ය බව අනාවරණයවීම ;

*ඇ.* අදාළ මාදිලි අනුමැති ප්‍රමිතීන්ට අනුකූල නොවන වෙළඳපළ වෙත නිකුත් කර ඇති මාදිලි අනුමැතිය ලත් ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වීම;

*ඈ.* ලියාපදිංචි කළ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සම්බන්ධයෙන් මෙම නීති උල්ලංඝනය කිරීම ;

*ඉ.* මාදිලි අනුමැති බලපත්‍රලාභියා කොමිෂන් සභාව යටතේ සිය වගකීම ඉටු කිරීමට නැවත නැවතත් අපොහොසත් වීම

*ඊ.* මාදිලි අනුමැති සහතික පත්‍රයේ සහ/හෝ මාදිලි අනුමැති ලේඛනයේ සටහන් කළ වෙළඳනාමය, ආකෘතිය, ස්වරූපය, ක්‍රියාකාරීත්වය හෝ කිසියම් වෙනත් තොරතුරක් සම්බන්ධයෙන් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණවල වෙනස්කම් සිදු කිරීම;

*උ.* ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණය මගින් වෙනත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයක හෝ විදුලි සංදේශ ජාලයක ක්‍රියාකාරිත්වයට අවහිරතා ඇතිකරලීම.

02. කොමිෂන් සභාව විසින් අදාළ මාදිලි අනුමැති ලාභියාට ඔවුන්ගේ මාදිලි අනුමැති සහතිකය අවලංගු කිරීම සහ එයට හේතු ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

03. මාදිලි අනුමැතිය අවලංගු කිරීම සහ එය අවලංගු කිරීමට හේතු පිළිබඳව කොමිෂන් සභාව සිය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ලැබේ. සැක සහිත ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ මාදිලි අනුමැති ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ. අවලංගු කරන ලද සියලුම මාදිලි අනුමැති සහතික මාදිලි අනුමැති ලේඛනයේ වෙන වෙනම දක්වනු ලැබේ.

04. මාදිලි අනුමැතිය අවලංගු කිරීම මත, මාදිලි අනුමැතිය අවලංගු කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ ප්‍රදර්ශණය කිරීම සඳහා අදාළ මාදිලි අනුමැතිලාභියාට අවසර ලබා දෙනු නොලැබේ. මාදිලි අනුමැතිය අවලංගු කිරීම මත ශ්‍රී ලාංකීය වෙළඳපලට ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු ඕනෑම පාර්ශවයක් දැනුම්දීමේ දින සිට දින අනුවක් (90) ඇතුළත අනුකූල නොවන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වෙළඳපළෙන් ඉවත් කර ගත යුතුය.

## VI කොටස : ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම.

**25. මාදිලි අනුමැතිය සඳහා නිදර්ශිත සාම්පලය(න්) ආනයනය කිරීම.**

(1) මාදිලි අනුමැතිය සඳහා නිදර්ශිත සාම්පලයක් ආනයනය කිරීමට අපේක්ෂා කරන්නෙකු කොමිෂන් සභාව වෙත ලිඛිතව අයදුම් කළ යුතු අතර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. අයදුම්කරුවන් තමා ආනයනය කරන ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයන්ගේ නිදර්ශිත සාම්පල (ය) පරිශිෂ්ට ඉ හි දක්වා ඇති පරිදි අදාළ වන තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල වන බවට වග බලා ගත යුතුය. එක් අයදුම්පතක් මගින් ආවරණය වන්නේ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණයේ විශේෂිත වෙළෙඳ නාමය සහ/හෝ ආකෘතිය පමණි. ආදර්ශිත සාම්පල (ය) ආනයනය කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීම සහ පසුව රේගු නිෂ්කාශණය සඳහා අදාළ අයදුම්පත් පිළිවෙලින් පරිශිෂ්ට 11 සහ පරිශිෂ්ට 1 මගින් ලබා ගත හැකිය. එක් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වර්ග සඳහා අවශ්‍ය උපරිම නිදර්ශිත සාම්පල සංඛ්‍යාව දෙකක් (02) නොඉක්මවිය යුතුය.

**26. වාණිජමය අරමුණු සහ පුද්ගලික පරිහරණය සඳහා ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම**

(1) දැනටමත් මාදිලි අනුමැතිය ලබා දී ඇති ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ වාණිජමය පරිමාණයෙන් ආනයනය කිරීම සඳහා වෙළෙඳ බලපත්‍රලාභින් විසින් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

(2) එමෙන්ම පරිශිෂ්ට ඈ හි නියම කර ඇති පරිදි නියමිත ගාස්තුවක් ගෙවීමට යටත්ව පුද්ගලයන්ට (පෞද්ගලික හෝ සංස්ථාපිත ආයතන) සිය පුද්ගලික පරිහරණය සඳහා මාදිලි අනුමත කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීමට අවසර ලබා දෙනු ලැබේ. මෙම රීති යටතේ මාදිලි අනුමත කරන ලද ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ ආනයනය කිරීම සඳහා පමණක් අවසර දෙනු ලැබේ.

(3) පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව, ස්වකීය පරිහරණය සඳහා මෙරටට රැගෙන ඒමට අවසර ලබා දිය හැකි උපරිම උපකරණ ප්‍රමාණයන් පහත දැක්වේ:

අ. ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) ප්‍රථමයෙන් ආනයනය කරන ලද දින සිට වසරක කාල පරිච්ඡේදයක් තුළ සියළුම වර්ග වලට අයත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) ඒකක පහක (05) ප්‍රමාණයක් ආනයනය කිරීමට පුද්ගලයන්ට අවසර ලබා දෙනු ලැබේ.

ආ. සංස්ථාපිත ආයතනයක් වූ විටෙකදී, ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) ප්‍රථමයෙන් ආනයනය කරන දින සිට වසරක කාල පරිච්ඡේදයක් තුළ සියලුම වර්ගවලට අයත් ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) වලින් මුළු ඒකක ප්‍රමාණය දහය (10) නොඉක්මවන පරිදි ආනයනය කිරීමට ඔවුන්ට අවසර ලබා දෙනු ලැබේ.

